# යාළු රැළක්



ලෝචනා රිදීමාලියද්ද



# යාළු රැළක්

© ලෝචනා රිදීමාලියද්ද
කර්තෘ ප්‍රකාශයකි.

ප්‍රථම මුද්‍රණය : 2025 ජනවාරි

**ISBN 978-624-208-260-8**

කර්තෘ : ලෝචනා රිදීමාලියද්ද

ලිපිනය : නො.43/17 A,
හේවාහැට පාර,
මහනුවර.

# පිදුම

සැමදා සෙවනැල්ලක් මෙන් මා පසුපස

සිටිනා මාගේ. ආදර දෙමව්පියන්ට හා

දැනුමෙන් අධ්‍යාපනයෙන් පමණක් නොව

ජීවන අවබෝධය ලබාදී මා නිරතුරුව

දැනුවත් කළ මාගේ ආදර ලලිතා කුමාරිහාමි

ගුරුතුමිය වෙත ආදරයෙනි.

# ස්තූතිය

කතන්දර පොත ලිවීමට මා උනන්දුකළ

මාගේ ආදර දෙමාපියන් සහ සොහොයුරිය

මාගේ හදපිරි තුතිමල් පුද දෙමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"සෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සාමා කුඩම්මා හැමදාම කාලා ඉතුරු බත්, වළං සෝදනකොට කහළ ගොඩට දැම්මා. දවසක් සාමා කුඩම්මාගෙ හිතට ආවා හොඳ අදහසක්. මට පුළුවන් ඉතුරු බත් අව්වෙ වේළලා, බැදලා, පැණි කලවම් කරලා ගොටු කරලා කඩේකට දෙන්න විකුණන්න.

හොඳ අදහසක් !

පසුවදා සාමා කුඩම්මා ඉතුරු බත් වට්ටියක දාලා වේළෙන්න අව්වේ තිබ්බා.



හොඳටම ඉර මුදුනට එනකම් ඉතුරු බත් වට්ටිය මිදුලෙ වේළුණා. සාමා කුඩම්මා ගෙයි වැඩ කළා. මිදුලේ විශාල කිචි ! බිචි ! සද්දයක් බැලූ විට දැක්කෙ කුරුලු රෑනක් ඉතුරු බත් වට්ටියට වහලා ඉස් පාසුවක් නැතිව කොට කොටා කන හැටි.



ටික වෙලාවයි ගතවුණේ. කුරුළු රෑන විසිරිලා ගියා. වට්ටිය හිස් සාමා කුඩම්මගේ වෙළෙඳාමේ සිහිනය මැකිලා ගියා. ඒත් සාමා කුඩම්මට ලැබුණේ පුදුම සතුටක්. කුරුළු රෑන බත් වට්ටියට වහ වැටිලා කොට කොට කෑ ලස්සන මුදලින් ගන්න බැරි තරම්.





ඒ නිසා සාමා කුඩස්සා හැමදාම ඉතුරු බත් වට්ටියෙ දාලා මිදුලෙ තිබ්බා. කුරුලු රෑන කොට කොටා බත් කෑ අලංකාරය බලමින් සිතේ ඇති කර ගත්තේ විශාල සතුටක්. හැමදාම සාමා කුඩම්මා මිදුලේ බත් වට්ටිය තිබ්බා.






දවසක් විශාල සුළඟක් ඇතිවුණා. ගස් කොළන් ඇඹරුණා. එදා සාමා කුඩම්මට බත් වට්ටිය මිදුලේ තියන්න බැරි වුණා.

සාමා කුඩම්මාගෙ හැට්ට රෙදි වැල්පොටේ තිබුණා. ටික වේලාවකට පසුව ඒවා සුළඟේ උඩ ගියා. සාමා කුඩම්මා ඒ ගැන දුක් වුණා. සාමා කුඩම්මා බලා සිටියා කොයි පළාතට සුළඟේ රෙදි ගහගෙන ගියාදෝ කියා.





වැස්ස පෑව්වා. සුළඟත් අඩුවුණා. පුදුමයකුයි සිද්ද වුණේ. කුරුල්ලන් රෑන උන්ගේ හොටවලින් ඩැහැගෙන ආවේ සාමා කුඩම්මගේ රෙදි හැට්ට. ඒවා ගෙනත් මිදුල පුරාම දාලා ආපසු පියඹලා ගියා. සාමා කුඩම්මාගේ සතුටයි පුදුමයයි කියන්න බැරි තරම්.



සතුන්ටත් යහපත්කම හොඳට තේරෙනවා. එකයි අපි සතුන්ට කරුණාව දක්වන්න ඕන කරන්නේ. සාමා කුඩම්මා අපි කාටත් දෙන අපූරු පාඩම.

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්